SRI LANKA

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# අදියර II විභාගය - 2026 ජනවාරි

# යෝජිත උත්තර

# (203) ව්‍යාපාර නීතිය (BLA)

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන: 011-2-559 669

මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අදියර II විභාගය - 2026 ජනවාරි

# (203) ව්‍යාපාර නීතිය

# යෝජිත උත්තර

(මුළු ලකුණු 25) **A කොටස**

## *පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

**1.1** (4)

**1.2** (3)

**1.3** (4)

**1.4** (1)

**1.5** (2)

**1.6** (2) *(එකකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 12)*

**1.7** අසත්‍යයි

**1.8** සත්‍යයි

**1.9** සත්‍යයි *(එකකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 03)*

**1.10** (පහත සඳහන් ඕනෑම දෙකක්)

- සුරැකුම්පත් වෙළඳපොළ සංවර්ධනය පිළිබඳව රජයට උපදෙස් දීම.
- බලපත්‍රලාභී කොටස් වෙළඳපොළක සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම සහ නිකුත් කිරීම නියාමනය කිරීම.
- ලැයිස්තුගත කිරීම සඳහා ඉදිරිපත් කරන ලද අදාළ අයදුම්පතක් ප්‍රතික්ෂේප කිරීම සඳහා බලපත්‍රලාභී කොටස් වෙළඳපොළ පරීක්ෂා කිරීම.
- බලපත්‍රලාභී කොටස් තැරැව්කරුවන්ගේ හෝ කොටස් අලෙවිකරුවන්ගේ, බලපත්‍රලාභී කළමනාකරණ සමාගමක හෝ ඒකක භාරයක භාරකරුවෙකුගේ, ලියාපදිංචි වෙළඳපොළ අතරමැදියෙකුගේ හෝ ඕනෑම ලැයිස්තුගත පොදු සමාගමක ඕනෑම ක්‍රියාකාරකමක් පිළිබඳව විමසීම සහ විමර්ශන පැවැත්වීම.
- සුරැකුම්පත් වෙළඳපොළ සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**1.11**

- අධිකරණමය ආරවුල් විසඳීම.
- විකල්ප ආරවුල් විසඳීම.
  - බේරුම්කරණය
  - සමථකරණය
  - වාණිජ මණ්ඩල

**1.12**

*(පහත සඳහන් ඕනෑම දෙකක්)*

- ගණුදෙනුකරු විසින් අණකරනු ලබන චෙක්පත් වලට නිසි පරිදි ගෙවීම.
- හැකි ඉක්මනින් ය ලබාගැනීමට කටයුතු කිරීම.
- චක්පත් අගරු වූ විට ගනුදෙණුකරුට දැනුම් දීම.
- ගෙවීම් නැවැත්වීමේ නියෝග/ ප්‍රතිනියෝග ක්‍රියාවට නැංවීම.

**1.13**

*(පහත සඳහන් ඕනෑම දෙකක්)*

- ලියමේ බලය
- නැවත විකිණීමේ බලය
- ගමන් කරමින් තිබෙන භාණ්ඩ මග නතර කිරෙමේ බලය

**1.14**

*(පහත සඳහන් ඕනෑම දෙකක්)*

- මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ ක්‍රම ශක්තිමත් කිරීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වීම.
- ශ්‍රී ලංකාව තුල මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ ක්‍රම ශක්තිමත් කිරීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම සඳහා තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා අදාළ අධිකාරීන්ට උපදෙස් ලබාදීම.
- ශ්‍රී ලංකාවේ අනුකූලතාවයන් පිළිගත් ජාත්‍යාන්තරව මට්ටමට දියුණු කිරීම.
- මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම සම්බන්ධයෙන් වන ජාත්‍යාන්තර ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම හා ජාත්‍යාන්තර රෙකමදාරු සහ යහපත් ක්‍රමවේදයන් ශක්තිමත් කිරීම.
- මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී මූල්‍යකරණ ක්‍රියාකාරකම් පිළිබඳ මහජන දැනුවත් කිරීම හා හැඟීමක් ඇති කිරීම.

***(එකකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 10)***

***(මුළු ලකුණු 25)***

***A කොටසෙහි අවසානය***

## දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

**පරිච්ඡේදය 08 - රක්ෂණ නීතිය**

**(a)** රක්ෂණ ගිවිසුමක් වලංගු වීමට නම් රක්ෂණීය හිමිකම තිබිය යුතුය. රක්ෂණයක් ලබාගන්නා පුද්ගලයාට එම වස්තුව **(Subject Matter)** ආරක්ෂා වීමෙන් ප්‍රතිලාභයක් ලැබීම හෝ/සහ එය විනාශ වුවහොත් ඔහුට පාඩුවක් සිදුවිය යුතුය. වෙනත් වචන වලින් කියනවා නම්, රක්ෂිතයාට එම වස්තුව පිළිබඳ අයිතියක්, වගකීමක් හෝ නීතිමය වශයෙන් ආර්ථික වාසියක් **(Legally Recognized Financial Interest)** තිබිය යුතුය. හානිය සිදුවන අවස්ථාවේ රක්ෂණීය හිමිකමක් නොතිබේ නම්, එම රක්ෂණ ගිවිසුම ක්‍රියාත්මක කළ නොහැක.

මෙම මූලධර්මය පැහැදිලි කරන ප්‍රධාන නඩුවක් වන්නේ **Macura v. Northern Assurance Co. Ltd.** යන නඩුවයි. එම නඩුවේදී **Macura** තම දැව කර්මාන්තය තමන්ට අයිති සීමසහිත සමාගමකට විකිණීය. ඔහු එම සමාගමේ ප්‍රධාන කොටස්කරු වුවද, අදාල දැව තොගය නීතිමය වශයෙන් ඉහත සමාගමට අයිති විය. සමාගම නීතිය ඉදිරියේ ස්වධීන ඒකකයක් වන බැවින්, එහි දේපළ කොටස්කරුවෙකුට පුද්ගලිකව අයිති නොවේ. නමුත් **Macura** දැව තොගය තමන්ගේ නමින් රක්ෂණය කර තිබුණි. මෙවන් තත්වයක් යටතේ අදාළ දැව තොගය ගිනි ගැනීමෙන් විනාශ වූ පසු ඔහු රක්ෂණ වන්දි **(Insurance Claim)** ඉල්ලා සිටින ලදී.

එවක බ්‍රිතාන්‍ය උපරිමාධිකරණය **(House of Lords)** තීරණය කළේ ඔහුට රක්ෂණීය හිමිකම නොතිබූ බවයි, මන්ද ඒ වන විට අදාළ දැව තොගය ඔහුට පුද්ගලිකව අයිති නොවූ නිසාය. කෙනෙකු කොටස්කරුවෙකු වූ පමණින් සමාගමේ දේපළට පුද්ගලික අයිතියක් නොලැබේ. එම නිසා ඔහුට රක්ෂණ වන්දි ලබාගැනීමට අයිතියක් නොතිබුණි.

මෙම මූලධර්මය සලකාබලන සිද්ධියට යෙදූ විට, ප්‍රනාන්දු **2024** ජනවාරි මාසයේදී අදාළ මෝටර් රථය රක්ෂණය කර ඇත. නමුත් **2024** අප්‍රේල් **01** දින **car** එක දිල්ෂාන් වෙත නිල වශයෙන් විකුණා ඇත. මෝටර් රථ අනතුර (හානිය) සිදු වූයේ **2024** අප්‍රේල් **08** දිනයි. එම අවස්ථාවේදී මෝටර් රථයේ අයිතිය දිල්ෂාන් වෙත ගොස් තිබුණි. එම නිසා ප්‍රනාන්දු ට වාහනය පිළිබඳ අයිතියක් හෝ මූල්‍යමය වාසියක් නොතිබුණි. හානිය සිදුවන අවස්ථාවේ රක්ෂණීය හිමිකම තිබිය යුතු බැවින්, ප්‍රනාන්දු ට රක්ෂණ ඔප්පුව යටතේ හානිය අයකරවා ගැනීමට කිසිදු අයිතියක් නොමැත.

ඊට අමතරව, රක්ෂණ ගිවිසුමක් කියන්නේ උපරිම විශ්වාසය **(Utmost Good Faith/ Uberrimae Fidei)** මත පදනම් වූ ගිවිසුම් වේ. එහිදී සියලු භෞතික දත්තයන් සහ තත්වයන් **(Material Facts)** සියල්ල රක්ෂකයා වෙත සම්පූර්ණයෙන් අනාවරණය කළ යුතුය. වාහනයේ අයිතිය වෙනත් කෙනෙකුට පවරා දීම භෞතික දත්තයන් සහ තත්වයන් සම්බන්ධ කරුණක් වන බැවින් එය රක්ෂකයාට දැනුම් දිය යුතුය. එය අනාවරණය නොකිරීමෙන්ද ප්‍රනාන්දු ගේ වන්දි හිමිකම්පෑම දුර්වල කරයි.

ඒ අනුව, **XYZ Insurance Ltd.** සමාගම විසින් ප්‍රනාන්දුට ගෙවූ මුදල ආපසු අයකරවා ගැනීමට හැකියාව ඇත. මන්ද අදාළ හානිය සිදුවූ අවස්ථාවේ ප්‍රනාන්දු ට රක්ෂණීය හිමිකම නොතිබූ බැවින් රක්ෂණ ගිවිසුමක අත්‍යවශ්‍ය කොන්දේසියක් සපුරා නොතිබූ හීතුවෙනි.

***(ලකුණු 06)***

**(b)** හානිපූර්ණ මූලධර්මය (**Principle of Indemnity**) කියන්නේ රක්ෂිතයාට (**Insured**) වන්දි වශයෙන් ලබාගත හැක්කේ ඇත්තටම සිදුවූ පාඩුවට (**Actual Loss**) සමාන ප්‍රමාණයක් පමණක් බවයි. එයට වඩා වැඩි මුදලක් ලබාගැනීමට අයිතියක් නැත. මෙම මූලධර්මයේ අරමුණ වන්නේ හානිය සිදුවීමට පෙර තිබූ ආර්ථික තත්ත්වයට රක්ෂිතයා නැවත ගෙන යාමයි.

ඒ අනුව, රක්ෂණය යනු ලාභයක් ලබාගැනීමට නිර්මාණය කර ඇති ක්‍රමයක් නොව, ඇත්තටම සිදුවූ හානියට පමණක් වන්දි ලබාදීමට (**Compensate**) නිර්මාණය කර ඇති ක්‍රමයකි.

***(ලකුණු 04)***
***(මුළු ලකුණු 10)***

## *තුන්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

**පරිච්ඡේදය 10 - ව්‍යාපාරික පරිසරයට අදාළ වැරදි**

**(a)**

**(i)**

- පාරිභෝගිකයින්ගේ ජීවිතයට හා දේපළවලට අනතුරුදායක භාණ්ඩ අලෙවි කිරීමෙන් හෝ සේවා සැපයීමෙන් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම.
- අසාධාරණ වෙළඳ පරිචයන්ගෙන් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සහ පාරිභෝගිකයින්ගේ අවශ්‍යතා නිසි ලෙස සලකා බලන බවට සහතික වීම.
- හැකි සෑම විටම තරඟකාරී මිල ගණන් යටතේ පාරිභෝගිකයින්ට භාණ්ඩ හා සේවා සඳහා ප්‍රමාණවත් ප්‍රවේශයක් ඇති බව සහතික කිරීම.
- අසාධාරණ වෙළඳ පරිචයන්ට එරෙහිව, තහනම් කරන ලද වෙළඳ පරිචයන්ට එරෙහිව හෝ පාරිභෝගිකයින් සූරාකෑමට ලක් කරන ඕනෑම වෙළඳ පරිචයකට එරෙහිව කටයුතු කර අලාභ/ හානි අය කරගැනීම.

***(ලකුණු 04)***

**(ii)**

*(පහත සඳහන් ඕනෑම දෙකක්)*

- ව්‍යවසාය අතර තහනම් කරන ලද වෙළඳ පරිචයන් පාලනය කිරීම සහ ඉවත් කිරීම.
- තරඟකාරීත්වයට එරෙහි පරිචයන් සහ ඒකාධිකාරී බලය යුතු ලෙස භාවිතා කිරීම පිළිබඳව විමර්ශනය කිරීම හෝ ප්‍රශ්න කිරීම.
- භාණ්ඩ හා සේවා සපයන පුද්ගලයින් අතර ඵලදායී තරඟකාරිත්වයක් පවත්වා ගැනීම සහ ප්‍රවර්ධනය කිරීම.
- භාණ්ඩ හා සේවාවල මිල, ලබා ගැනීමේ හැකියාව සහ ගුණාත්මකභාවය සහ සපයනු ලබන භාණ්ඩ හා සේවාවල විවිධත්වයට අදාළව පාරිභෝගිකයින්, ගැනුම්කරුවන් සහ භාණ්ඩ හා සේවා භාවිතා කරන්නන්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතා ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම.
- මිලදී ගැනීම සඳහා ඇති භාණ්ඩ හා සේවාවල ගුණාත්මකභාවය, ප්‍රමාණය, ශක්‍යතාවය, පිරිසිදු බව, ප්‍රමිතීන් සහ මිල පිළිබඳව පාරිභෝගිකයින් දැනුවත් කිරීම.
- මෙම පනතේ නිශ්චිතව දක්වා ඇති ඕනෑම කරුණක් සම්බන්ධයෙන් විමර්ශන සහ විමසීම් සිදු කිරීම.

***(ලකුණු 02)***

**(b)**

*(පහත සඳහන් ඕනෑම දෙකක්)*

- බුද්ධිමය දේපළ සම්බන්ධ නීතිය සඳහා විධිවිධාන සැලසීම.
- බුද්ධිමය දේපළලියාපදිංචි කිරීම, පාලනය සහ පරිපාලනය සඳහා කාර්යක්ෂම ක්‍රියා පටිපාටියක් සැපයීම.
- ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල් ධූරය ඇති කිරීම.
- පළාත්බද මහාධිකරණය (විශේෂ) විධිවිධාන පනත සහ රේගු ආඥා පනත සංශෝධනය කිරීම.
- ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලසීම.

***(ලකුණු 04)***
***(මුළු ලකුණු 10)***

## *හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

| ***පරිච්ඡේදය - නියෝජ්‍යත්ව නීතිය*** |
|---|

**(a)** වට්ටම් සහිත විකුණුම් සම්බන්ධයෙන් ගනුදෙනුකරුවන් සමග සාකච්ඡා කිරීමට නිමල් සතු අධිකාරිය, ව්‍යංග අධිකාරිය මූලධර්මය (**implied authority**) යටතේ පරීක්ෂා කළ හැකි අතර, එය පැන නගින්නේ ප්‍රධානියෙකු නිශ්චිත තනතුරකට නියෝජිතයෙකු පත් කරන විට සහ නියෝජිතයාට එම භූමිකාවට සම්බන්ධ ක්‍රියාවන් නිතිපතා කිරීමට බලය පවරන විට, පැහැදිලිව ප්‍රකාශ නොකළත්, ව්‍යංග අධිකාරිය න්‍යායට අනුව, නියෝජිතයෙකුගේ ව්‍යංග අධිකාරිය යටතට සිය ක්‍රියාව ගැනෙනවාද යන්න විනිශ්චය කරනු ලබන්නේ තනතුරේ ස්වභාවය, ව්‍යාපාරික සිරිත් විරිත් සහ අතීත භාවිතයන් සැලකිල්ලට ගෙනය.

**Hely-Hutchinson v Brayhead Ltd** නඩුවේදී, බ්‍රේහෙඩ් ලිමිටඩ් සමාගමේ (ප්‍රධානියා) හි කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස රිචඩ්(නියෝජිත), බ්‍රේහෙඩ් ලිමිටඩ් හි ප්‍රකාශිත අවසරයකින් තොරව හෙලි-හචින්සන් (ණයහිමි) සමඟ වන්දි ගිවිසුමකට එළඹුණි. මේ තත්වය යටතේ උක්ත ණය අත්තිකාරම සඳහා පහසුකම් සැලසීම සඳහා වන්දි හෙලි-හචින්සන්ට ලබා දීමට බ්‍රේහෙඩ් ලිමිටඩ් සමාගම වගකීමකට යටත් විය. ඒ මන්දයත් රිචඩ්ගේ තනතුර සහ වගකීම් සැලකිල්ලට ගත කල , ඔහුට ප්‍රකාශිත කැමැත්තක් නොතිබුණද සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයා වශයෙන්, සමාගම බැඳ තබමින්, වන්දි ගෙවීමට ඔහුට ව්‍යංග බලයක් ඇති බව අධිකරණය තීරණය කළේය.

ඒ හා සමානව ගත් කල සලකාබලන රෙදිපිළි ව්‍යාපාරයේ සිද්ධියේදී ද, වට්ටම් සහිත අනුපාත යටතේ තොග ඇණවුම් සාකච්ඡා කිරීම ව්‍යාපාරයේ සාමාන්‍ය සිරිතක් නම්, දෛනික මෙහෙයුම් භාරව සිටින නිමල්, නිත්‍ය ගනුදෙනුකරුවන් සඳහා වට්ටම් ලබාදීම සාමාන්‍ය පිළිවෙතක් බව ද දැන සිටියේ නම්, කුමාර නිමල්ට **15%** ක වට්ටමක් ලබා දීමට ප්‍රකාශිතව අවසර දී නොතිබුණද, ඔහුගේ ක්‍රියාවන් සාමාන්‍ය ව්‍යාපාරික ගනුදෙනු සිදු කිරීමට අවශ්‍ය වූ බැවින්, ව්‍යංග අධිකාරියේ විෂය පථයට අයත් වේ. එමෙන්ම කර්මාන්ත ප්‍රමිතීන් තුළ නම්, **15%** ක වට්ටමක් ව්‍යංග අධිකාරිය තුළ සලකා බැලීමට ඉඩ ඇත. ව්‍යංග අධිකාරියේ න්‍යාය අවධාරණය කරන්නේ යහපත් විශ්වාසයකින් ක්‍රියා කරන තෙවන පාර්ශවයන් නියෝජිතයාගේ සම්ප්‍රදායික බලතල මත විශ්වාසය තැබිය හැකි බවත්, සීමාවන් බාහිර පුද්ගලයින්ට සන්නිවේදනය නොකළහොත් ප්‍රධානියා එය ඉටු කිරීමට බැඳී සිටින බවත්ය. මෙහි දී නිමල්ට එලෙස කිරීමට කුමාර බලය ලබා නොදී තිබූ බව තුන්වන පාර්ශවයන්ට සන්නිවේදනය කර නොතිබුණි. එබැවින් එහි ප්‍රතිඵලයක් ලෙස, කුමාර (ප්‍රධානියා)මෙම ගනුදෙනුවලට ගරු කිරීමට නීත්‍යානුකූලව බැඳී සිටින අතර, ගනුදෙනුකරුවන්ට (තුන්වන පාර්ශවයන්ට) තම තොග ඇනවුම බෙදා හැරීම ඉල්ලා සිටීමට අයිතියක් ඇත. ***(ලකුණු 05)***

**(b)**

**ABC Ltd** සමාගමෙන් සේවාවන් ලබාගැනීමට නිමල් ගත් තීරණය, අවශ්‍යතාව මත නියෝජ්‍යත්වය ඇති වීම මූලධර්මය (**Agency by Necessity)** යටතේ පරීක්ෂා කළ යුතුය. මෙම මූලධර්මය නියෝජිතයෙකුගේ අධිකාරියේ පටු සහ සුවිශේෂී දිගුවක් ලෙස ක්‍රියාත්මක වන අතර, ප්‍රධානියාගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා ක්ෂණික ක්‍රියාමාර්ග ගැනීමට යම් යම් තත්වයන් බල කරන අවස්ථාවන් වලදී පමණක්, නියෝජිත ගන්න තීරණ සඳහා නියෝජිතයාට ප්‍රධානියාගේ පූර්ව අවසරයකින් තොරව සිය ප්‍රධානියා බැඳීමට යටත් කිරීමට ඉඩ සලසයි.

අධිකරණය මෙම මූලධර්මය ප්‍රවේශමෙන් හඳුනා ගන්නා අතර එහිදී නියෝජිතට අවශ්‍යතාවය මත නියෝජ්‍යත්වය මත ක්‍රියා කිරීමට බල කරන ලද සුවිශේෂී තත්වය අධිකරණය විසින් තීරණය කරනුයේ එවැනි මැදිහත්වීමක් සැබවින්ම කිරීම යුක්ති සහගත වූ බවට පැහැදිලි සාක්ෂි තිබුනා නම් පමණි.

පළමුව, නියෝජිතට සැබෑ හදිසි අවස්ථාවක් තිබිය යුතුය. වායු සමීකරණ පද්ධතිය බිඳ වැටුණු අතර, රෙදිපිළි තොගයට හානි වීම වැළැක්වීම සඳහා වායු සමීකරණ අලුත්වැඩියාව සිදු කරන ලදී. රෙදිපිළි ව්‍යාපාරයක, අධික තාපය සහ ආර්ද්‍රතාවය රෙදිපිළි පිරිහීමට හෝ දුර්වර්ණ වීමට හේතු විය හැක. එබැවින්, වායු සමීකරණ බිඳවැටීම සැබෑ හදිසි අවස්ථාවක් බවට පත්විය හැකි වාණිජ අවදානමක් ඇති කල තත්වයකි. වායු සමීකරණ පද්ධතිය අසාර්ථක වූ විට වටිනා රෙදිපිළි තාප හානියෙන් ආරක්ෂා කිරීමේ හදිසි අවශ්‍යතාවය ඕනෑම සාධාරණ නියෝජිතයෙකු හඳුනා ගන්නා බැවින්, ඔහුගේ ක්‍රියාව රැකවරණය සහ කුසලතාවයේ යුතුකම ද ඉටු කරයි.

දෙවනුව, ප්‍රධානියාගෙන් උපදෙස් ලබා ගැනීම කළ නොහැකි හෝ ප්‍රායෝගික නොවන තත්වයක පැවතිය යුතුය. කුමාර මාස දෙකක් විදේශගතව සිටියද, දුරකථන සහ විද්‍යුත් තැපැල වැනි නවීන සන්නිවේදන ක්‍රම මඟින් ප්‍රධානියා විදේශගතව සිටියදී පවා උපදෙස් ලබා ගැනීම සාපේක්ෂව පහසු කරයි. කුමාරට ළඟා විය නොහැකි බව ප්‍රශ්නයෙන් ඇඟවෙන්නේ නැත.

<u>**Surrey Breakdown Ltd**</u> **v** <u>**Knight**</u> නඩුවේදී, තම ගරාජ හිමිකරුගේ අධිකාරිය (බලය) නොමැතිව නියෝජිත විසින් වාහනයක් සොයා ගෙන ගබඩා කළ නමුත්, නියෝජිතට මේ සම්බන්ධයෙන් විමසීමක් කිරීමට හිමිකරුට සම්බන්ධ විය හැකිව තිබූ බැවින් අධිකරණය අවශ්‍යතාවය මත ඒජන්සිය ප්‍රතික්ෂේප කළේය; හුදෙක් අපහසුතාවයක් හෝ ප්‍රමාදයක් ප්‍රමාණවත් නොවීය. ඒ හා සමානව, සලකාබලන සිදුවීමේ කුමාර සමඟ සන්නිවේදනය සැබවින්ම ප්‍රායෝගික නොවන බව නිමල්ට ඔප්පු කළ නොහැකි නම්, මෙම අවශ්‍යතාවය සපුරාලිය නොහැක.

තෙවනුව, ප්‍රධානියාගේ දේපළ ආරක්ෂා කිරීම සඳහා නියෝජිතගේ ක්‍රියාව සාධාරණ හා විචක්ෂණශීලි ලෙස ගෙන තිබිය යුතුය. මෙම අවස්ථාවේ දී, වටිනා රෙදිපිළි තොගයට සැලකිය යුතු අලාභයක් වැළැක්වීම සඳහා රු. **150,000** ක් වැය වන ක්ෂණික අලුත්වැඩියාව වාණිජමය වශයෙන් සාධාරණ බව පෙනේ. ලබා දී ඇති කරුණු මත, සාධාරණ අවශ්‍යතාවයක් සපුරා ඇත.

නිමල් සද්භාවයෙන් ක්‍රියා කළ අතර ප්‍රතිවිරුද්ධ උපදෙස් නොතිබූ බැවින් (එය එසේ නොකරන ලෙසට ප්‍රධානියාගෙන්), අවශ්‍යතාව මත නියොජ්‍යත්වය ඇති වීමේ මූලධර්මයට අදාල එකක් හැර සියලුම අංග ඉටු වේ (ප්‍රධානියා වගකීමට යටත් කිරීමට අදාලව). නමුත් කුමාරගේ (ප්‍රධානියාගේ)

උපදෙස් ලබා ගැනීම සැබවින්ම ප්‍රායෝගික නොවනවාද යන්න තව දුරටත් තීරණාත්මක ගැටළුව ලෙස පවතී.

එබැවින්, එම අවස්ථාවේදී සන්නිවේදනය සැබවින්ම ප්‍රායෝගික නොවූ බව නිමල්ට (නියෝජිත) අධිකරණය හමුවේ ඔප්පු කළ නොහැකි වුවහොත්, කුමාර **ABC Ltd.** වෙත ගෙවීම් කිරීමේ වගකීමෙන් නීත්‍යානුකූලව බහරවී, අලුත්වැඩියා පිරිවැය සඳහා නිමල්ට පෞද්ගලිකව වගකීමට බැඳෙන අතර අනෙක් අතට ඔප්පු කිරීමට නිමල් සමත් වුවහොත් කුමාර (ප්‍රධානියා) අවශ්‍යතාව මත නියෝජ්‍යත්වය ඇති වීමේ මූලධර්මය යටතේ අදාල සමාගමට අලුත්වැඩියා පිරිවැය ගෙවීමට බඳිසිටියි.

***(ලකුණු 05)***

***(මුළු ලකුණු 10)***

## *පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

**පරිච්ඡේදය 05 - සමාගම් නීතිය**

**(a)**

සංගම් ව්‍යවස්ථාවලිය මගින්,

- සමාගමේ අරමුණු.
- සමාගමේ කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් සහ බැඳීම්.
- සමාගමේ කළමනාකරණය සහ පරිපාලනය
- සමාගමක ඕනෑම කරුණක් සම්බන්ධයෙන් සමාගම් පනතට පටහැනි නොවන ආකාරයේ වෙනත් ඕනෑම ප්‍රතිපාදන සැලැස්වීමට සමාගමට හැකියාව ඇත.

***(ලකුණු 03)***

**(b)**

- ස්වභාවික පුද්ගලයෙකු විය යුතුය (සමාගමක් හෝ ව්‍යවස්ථාපිත ආයතනයක් නොවේ).
- වයස අවුරුදු **18** හෝ ඊට වැඩි විය යුතුය.
- නිදහස් නොකළ බංකොලොත් පුද්ගලයෙකු නොවිය යුතුය.
- සිහිවිකළ තැනැත්තෙක් බවට විනිශ්චය නොකළ යුතුය.
- සාංගමික ව්‍යවස්ථාවේ ඇති සුදුසුකම් හෝ සීමාවන්ට අනුකූල විය යුතුය.
- **2007** අංක **07** දරන සමාගම් පනතේ **213** හෝ **214** වගන්ති යටතේ තහනම් නොකළ තැනැත්තෙකු විය යුතුය.
- **201 (**අධ්‍යක්ෂකවරු ගණන) වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කිරීමට ලිඛිත කැමැත්ත ලබා දිය යුතුය.

***(ලකුණු 04)***

**(c)**

පහත සඳහන් හේතු මගින් සමාගමක අධ්‍යක්ෂවරයෙකුගේ තනතුර හිස් වේ**.**

- අධ්‍යක්ෂවරයා විසින් සිය ධුරයෙන් ඉල්ලා අස් වුවහොත්. අධ්‍යක්ෂවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබීම හේතුවෙන්.
- **202** වගන්තියේ විධිවිධාන අනුව නුසුදුස්සෙකු බවට පත්වීමෙන්.
- අධ්‍යක්ෂවරයෙකුගේ මරණය හේතුවෙන්.
- **210 (1)** වගන්තියට අනුව**,** පොදු සමාගමක හෝ පොදු සමාගමක අනුබද්ධිත පෞද්ගලික සමාගමක අධ්‍යක්ෂවරයෙකු වයස අවුරුදු හැත්තෑව **(70)** සම්පූර්ණ වූ පසු ධුරයෙන් ඉවත් විය යුතුය.
- අධ්‍යක්ෂවරයා සාංගමික ව්‍යවස්ථාවලියේ විධිවිධාන ප්‍රකාරව අන් ආකාරයකින් ධුරය හිස් කිරීම.

***(ලකුණු 03)***

***(මුළු ලකුණු 10)***

aat SRI LANKA

## *හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

| පරිච්ඡේදය 07 - කම්කරු නීතිය |
| --- |

**(a)**
ප්‍රියංකා සේවිකාවකි.

කම්කරු නීතිය යටතේ, යම් සේවකයෙක් සැබවින්ම සේවකයෙක්ද නැතහොත් ස්වාධීන කොන්තරත්කරුවෙක්ද යන්න සම්බන්ධයෙන් උසාවිය බහු (සංයුක්ත) පරීක්ෂණ අදාල කරගන්නා අතර යම් සේවකයෙක්ගේ අදාළ ගිවිසුමේ "ස්වාධීන කොන්ත්‍රාත්කරු" යන ලේබලයට වඩා සේවකයෙක් සිය සේවායෝජක සමග ඇති සම්බන්ධතාවයේ සැබෑ ස්වභාවය සලකා බලයි.

පාලන පරීක්ෂණය (**Control Test**) යටතේ සලක බැලීමේදී, ප්‍රියංකා නිශ්චිත වේලාවන් හී දී (සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව. **9.00** - ප.ව. **5.00**) වැඩ කරයි; ඇගේ අධීක්ෂක විසින් පවරන ලද කාර්යයන් ඉටු කරයි; සහ කේත වෙනස්කම් සඳහා අනුමැතිය අවශ්‍ය වේ. මෙය සැලකිය යුතු මට්ටමකින් සේවායෝජක විසින් සේවකයා පාලනයක් පෙන්නුම් කරයි.

උපකරණ පරීක්ෂණය (**Equipment Test**) යටතේ සලකා බැලීමේදී, ඇය සමාගමේ පරිශ්‍රයේ සේවය කරන්නේ සේවක තත්ත්වයට සහාය වන **TechSoft (Pvt) Ltd** සමාගම විසින් සපයනු ලබන උපකරණ සහ මෘදුකාංග භාවිතා කරමිනි.

ඒකාබද්ධ පරීක්ෂණය(**Integration Test**) යටතේ, මෘදුකාංග සංවර්ධනය සමාගමේ මූලික කාර්යය වන අතර ඇගේ කාර්යය ව්‍යාපාරයට අත්‍යවශ්‍ය කාර්යයක් වේ.

ආර්ථික සත්‍යතා පරීක්ෂණය (**Economic Reality Test**) යටතේ ගත් කල, ඇයට **EPF** සහ **ETF** දායකත්වයන් සමඟ රු. **150,000** ක ස්ථාවර මාසික වැටුපක් ලැබෙන අතර එය සමාගම මත ඇයගේ ආර්ථික යැපීම පෙන්නුම් කරයි. (වැටුපකට වැඩකරන සේවකයෙකුට තම කාර්යයේ අවසාන සෘජු ප්‍රතිලාබ ලැබීමක් සිදු නොවේ.)

ඇය සති අන්තයේ කුඩා නිදහස් ව්‍යාපෘති භාර ගත්තද, මෙය ස්වයංක්‍රීයව ඇයව ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකු බවට පත් නොකරයි. බොහෝ සේවකයින් ද්විතීයික රැකියාවල නිරත වේ. ඇයගේ ප්‍රාථමික රැකියාව පාලනය, ව්‍යුහගත කිරීම සහ ආර්ථික වශයෙන් **TechSoft** මත රඳා පවතින බැවින්, නිදහස් රැකියාව ඇගේ ප්‍රධාන තත්ත්වය වෙනස් නොකරයි.
එබැවින්, ප්‍රියංකා ස්වාධින කොන්තරාත්කරුවෙකු (**independent contractor**) නොවන අතර සේවිකාවක්(**employee**) ලෙස වර්ගීකරණය කල හැක.

***(ලකුණු 04)***

**(b)** (පහත සඳහන් ඕනෑම තුනක්)

- රැකියාවෙන් විශ්‍රාම ගැනීම
- රැකියාව අවසන් කිරීමේ ඕනෑම අවස්ථාවක, එනම් රැකියාව වෙනස් කිරීම, සේවයෙන් පහ කිරීම, ඉල්ලා අස්වීම, තනතුරෙන් ඉවත් කිරීම.
- ස්ථිර සහ සම්පූර්ණ රැකියා ආශාක්නුතාව.
- සේවකයාගේ මරණයකදී.

***(ලකුණු 03)***

**(c)** (පහත සඳහන් ඕනෑම තුනක්)

- සේවක සංඛ්‍යාව 15 ට අඩු ආයතනවල සේවය කරන සේවකයින්.
- මාස 12 ක අඛණ්ඩ සේවා කාලයක් තුළ දින 180 කට අඩු කාලයක් සේවය කර ඇති සේවකයින්.
- රජයේ, පළාත් පාලන ආයතන, රජයේ සංස්ථා වල හෝ සමුපකාර සංගම් වල සේවකයින්.
- සේවා ගිවිසුම අනුව හෝ සාමූහික ගිවිසුම් අනුව තීරණය කරන ලද විශ්‍රාම යාමේ වයස අනුව විශ්‍රාම ගොස් ඇති සේවකයින්.

***(ලකුණු 03)***
***(මුළු ලකුණු 10)***

***B කොටසෙහි අවසානය***

## හත්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

**පරිච්ඡේදය 2 - ගිවිසුම් නීතිය**

**(A) (a)**

අහහරුවාදා, රුවන් සහ මහේෂ් අතර වලංගු ගිවිසුමක් ඇති කර නොගත්තේ, ඉතා වැදගත් අංගයක් වන අර්පණය සන්නිවේදනය වීමේ අවශ්‍යතාවය සපුරා නොමැති ව තිබුණු බැවිනි. ගිවිසුම් නීතියට අනුව, අර්පනයක් ප්‍රතිග්‍රහණය කිරීමට පෙර එය අර්පණලාභියාට සන්නිවේදනය වී තිබිය යුතුය. අර්පණකරු අර්පණයක් ලිඛිතව කිරීමට හෝ එම අර්පණය අවසන් කිරීමට පවා අදහස් කරන විට, ඒ බව (අර්පණය) අර්පණලාභියාව දැනුවත් වන තෙක්/ දැනුමට ගෙන යන තෙක් පාර්ශවයන් අතර නීතිමය අයිතිවාසිකම් නිර්මාණය නොකරයි. (වලංගු ගිවිසුමක් ඇති නොකරයි.)

සලකාබලන සිද්ධියේ දී, රුවන් සඳුදා දින කිලෝග්‍රෑමයකට රු. **1,500** බැගින් උසස් තත්වයේ ලංකා තේ (***Premium Ceylon Tea)*** කිලෝග්‍රෑම් **500** ක් විකිණීමට ලිඛිත අර්පණයක් සකස් කළ අතර එය සිකුරාදා දක්වා විවෘතව පවතින බව ප්‍රකාශ කළද, ඔහු එය පළ කිරීමට හෝ වෙනත් ආකාරයකින් සන්නිවේදනය කිරීමට අපොහොසත් වූ අතර ලිපිය ඔහුගේ ලාච්චුවේ පැවතුනි. එබැවින්, අහහරුවාදා වන විට, මහේෂ් වෙත කිසිදු අර්පණයක් නීත්‍යානුකූලව සන්නිවේදනය කර නොතිබුණි. සන්නිවේදනයකින් තොරව, නීතිය ඉදිරියේ වලංගු අර්පණයක් නොමැත.

මහේෂ්ගේ දැනුම ලැබුණේ ඔහුගේ මිතුරා වන සිල්වාගෙන් වන අතර, ඔහු රුවන් එම මිලට තේ විකිණීමට සැලසුම් කරන බව ඔහුට දැනුම් දී තිබෙන්නට ඇතැයි උපකල්පනය කල හැකිය. කෙසේ වෙතත්, තෙවන පාර්ශවයකින් (සිල්වාගෙන්) ලැබුණු තොරතුරු අර්පනයක් පිළිබඳ නීත්‍යානුකූල සන්නිවේදනයක් නොවේ.

මෙම මූලධර්මය **<u>Bloom v</u> <u>American Swiss Watch Company</u>** නඩුවෙ හි විනිශ්චය කර ඇත. ***American Swiss Watch*** සමාගමේ ඔරලෝසු සොරකමක් සිදුවිය. සමාගම සොරකම් කරන ලද ඔරලෝසු නැවත ලබා ගැනීමට තොරතුරු සපයන්නෙකුට ත්‍යාගයක් පිරිනැමීමට තීරණය කළේය. ත්‍යාග දීමනාව නිසි ලෙස මහජනතාවට සන්නිවේදනය කිරීමට පෙර, මෙම ගිවිසුම් කඩ කිරීම සම්බන්ධ නඩුවේ, පැමිණිලිකරු දේපළ නැවත ලබා ගැනීමට උපකාරී වන තොරතුරු ලබා දුන්නේය. පසුව ඔහු ත්‍යාගය ඉල්ලා සිටියේය. නමුත් ඔහු ක්‍රියා කළ අවස්ථාවේ දී අර්පණය පැමිණිලිකරුට ඵලදායී ලෙස සන්නිවේදනය කර නොතිබූ නිසා කිසිදු ගිවිසුමක් ඇති වී නොමැති බව අධිකරණය තීරණය කළේය. තොරතුරු සපයන (ක්‍රියාත්මක වීම මගින් ප්‍රතිග්‍රහණය) විට අර්පණය පිළිබඳව ඔහු නොදැන (සන්නිවේදනය වී නොමැත) සිටි බැවින්, වලංගු ප්‍රතිග්‍රහණයක් සහ එබැවින් වලංගු ගිවිසුමක් ද තිබිය නොහැක.

මෙහිදී සලකා බලන සිදුවීමට එම මූලධර්මය අදාළ කර ගනිමින්, අහහරුවාදා රුවන් මහේෂ් වෙත කිසිදු අර්පණයක් සන්නිවේදනය කර නොතිබුණි. සිල්වාගෙන් මහේෂ් ලබාගත් තොරතුරු හුදෙක් කටකතා හෝ නිල නොවන දැනුමක් වන අතර එය අර්පණකරු විසින් සන්නිවේදනය කිරීමකට සමාන නොවේ. මහේෂ් තමා අර්පණය පිළිගත් බව ප්‍රකාශ කළ විට, නීත්‍යානුකූලව ප්‍රතිග්‍රහණය කිරීමක් වශයෙන් එය සැලකිය නොහැකිය. එයට හේතුව ප්‍රතිග්‍රහණය කිරීම සඳහා වලංගු අර්පනයක් ඒ වන විට නොතිබූ බැවිනි. එබැවින්, වලංගු ගිවිසුමක් ඇතිවීමට අත්‍යවශ්‍ය අංගවලින් එකක් වන සන්නිවේදනය කරන ලද අර්පණයක් මෙහි නොමැති බව හොඳින් විද්‍යමාන වේ.

ඒ අනුව, අහහරුවාදා රුවන් සහ මහේෂ් අතර වලංගු ගිවිසුමක් ඇතිවී නොමැති බව පැහැදිලි වේ.

***(ලකුණු 06)***



at SRI LANKA

**(b)**

මෙහි ඇති ගැටළු ද්විත්වයකි. පළමුව බ්‍රහස්පතින්දා දින මහේෂ් ඔහුගේ ප්‍රතිග්‍රහණ ලිපිය තැපැල් කළ විට ඒ මගින් වලංගු ගිවිසුමක් ඇති වුවා ද යන්න සහ දෙවනුව සිකුරාදා උදැසන රුවන්ගේ අර්පණය ඉල්ලා අස්කරගැනීම නීත්‍යානුකූලව ක්‍රියාත්මක වූවාද යන්නයි. මේ සඳහා ශීඝ්‍ර තැපැල් න්‍යාය (***Postal Rule of Acceptance)*** වැදගත් වේ.

ගිවිසුම් නීතියේ ප්‍රතිග්‍රහණය සම්බන්ධ සාමාන්‍ය රීතිය යටතේ, වලංගු ප්‍රතිග්‍රහණයක් ඇතිවීමට නම් ප්‍රතිග්‍රහණය අර්පණකරුට සන්නිවේදනය විය යුතුය. කෙසේ වෙතත්, තැපැල් රීතිය එයට ව්‍යතිරේකයකි (***exception).***

**<u>Adams</u> v <u>Lindsay</u>** හි ස්ථාපිත රීතියට අනුව සන්නිවේදන මාධ්‍යයක් ලෙස තැපැල භාවිතා කිරීම සාධාරණ වන අවස්ථාවක, ප්‍රතිග්‍රහණය සම්පූර්ණ වන්නේ (අර්පණකරුට සන්නිවේදනය වන්නේ) ප්‍රතිග්‍රහණ ලිපිය ලැබුණු විට නොව, නිසි ලෙස තැපෑලට දැමූ මොහොතේය. ඒ අනුව මෙහිදී, අර්පණලාභියාගේ ප්‍රතිග්‍රහණය තැපෑලෙන් ප්‍රමාද වූ අතර, ඒ අතරවාරයේ අර්පණකරු වෙනත් තැනැත්තෙකුට දෙපක විකිණීය. නමුත් එලෙස වෙනත් පාර්ශවයකට විකුණන අවස්ථාව වන විටත් අර්පන ලාභියාගේ ප්‍රතිග්‍රහණ ලිපිය අර්පණකරුට ලැබී නොතිබුණද, ප්‍රතිග්‍රහණ ලිපිය තැපැල් කරන අවස්ථාවේ දීම ප්‍රතිග්‍රහණය අර්පනකරුට සන්නිවේදනය වුවා යැයි ශීඝ්‍ර තැපැල් න්‍යාය අනුව සලකන බැවින් ඒ මගින් වලංගු ගිවිසුමක් ඇතිවන බව අධිකරණය තීරණය කළේය.

සලකාබලන සිදුවීමට මෙම මූලධර්ම අදාළ කරමින්, රුවන්ගේ අර්පණ ලිපිය බ්‍රහස්පතින්දා උදැසන මහේෂ් වෙත ළඟා විය. හොඳින් සලකා බැලීමෙන් පසු, මහේෂ් බ්‍රහස්පතින්දා කොළඹ තැපැල් කාර්යාලයෙන් ඔහුගේ ප්‍රතිග්‍රහණය කිරීමේ ලිපිය තැපැල් කළේය. ඒ මොහොතේ, තැපැල් රීතියට අනුව, ප්‍රතිග්‍රහණය සම්පූර්ණ වූ අතර නීත්‍යානුකූල ගිවිසුමක් ඇති වේ. (තවද එය සාධාරණ සාධාරණ සන්නිවේදන ක්‍රමයක් වන්නේද යන්න ප්‍රශ්නයට නැගුවහොත්, එය මෙම සිද්ධියේ සැබවින්ම සාධාරණ සන්නිවේදන මාධ්‍යයක් ලෙස දැක්වීමට හැකි වන අතර එයට හේතුව වන්නේ, පැහැදිලිවම රුවන් විසින්ම අර්පණය කර ඇත්තේ ද තැපැල් සේවය භාවිතා කරමින් බැවිනි.)

දෙවන ප්‍රස්තුතයට ප්‍රවිෂ්ඨ වීමේදී සිකුරාදා පෙ.ව. **10.00** ට, රුවන් වෙනත් ගැනුම්කරුවෙකුගෙන් වඩා හොඳ අර්පනයක් ලැබීමෙන් පසු මහේෂ්ට කල අර්පණය අවලංගු කිරීමේ ලිපියක් තැපැල් කළේය. කෙසේ වෙතත්, ප්‍රතිග්‍රහණය සම්පූර්ණ වීමට පෙර අර්පණයක් අවලංගු කරන්නේ නම් එය අර්පණලාභියාට දැනුම් දිය (සන්නිවේදනය කල) යුතුය. කෙසේ වෙතත් බ්‍රහස්පතින්දා දින මහේෂ්ගේ ප්‍රතිග්‍රහණ ලිපිය තැපැල් කර තිබූ බැවින් එම මොහොතේ (බ්‍රහස්පතින්දා) ප්‍රතිග්‍රහණය වලංගු ලෙස බලාත්මක වූ බැවින්, සිකුරාදා උදැසන රුවන්ගේ අවලංගු කිරීම ප්‍රමාද වූ අවලංගු කිරීමකි (එය වලංගු නොවන අවලංගු කිරීමක්). එනම් ඒ වන විටත් රුවන් හා මහේෂ් අතර බ්‍රහස්පතින්දා දින අලංගු ගිවිසුමක් හටගෙන ඇත.

මෙවන් තත්වයක්‍යටතේ තෙවන පාර්ශවයකට රුවන් විසින් තේ විකුණා තිබීම ගිවිසුම් කඩ කිරීමකි.

ඒ අනුව, විශේෂයෙන් කිලෝග්‍රෑමයකට රු. **1,500** බැගින් එකඟ වූ තේ කිලෝග්‍රෑම් ***500*** ක් ලබා නොදී ගිවිසුම කඩ කිරීම සම්බන්ධයෙන් මහේෂ්ට රුවන්ට එරෙහිව නීතිමය පියවර ගත හැකිය.

❖ ***<u>අමතර තොරතුරු</u>***

| **දිනය සහ වෙලාව** | සිද්ධිය | **නීතිමය සංකල්පය** |
|---|---|---|
| **සඳුදා** | සිකුරාදා දක්වා වලංගු වන, Premium Ceylon Tea කිලෝග්‍රෑම් 500ක් රු. 1,500/kg බැගින් විකිණීම සඳහා රුවන් ලිඛිත අර්පණයක් සකස් කරයි. ලිපිය ඔහුගේ ලාච්චුවේ තිබේ. | **අර්පණයක් සන්නිවේදනය කළ යුතුය -** නොයැවූ අර්පණයක් නීත්‍යානුකූල නොවේ. ***(<u>Lalman Shukla</u> v <u>Gauri Dutt</u> / <u>Bloom</u> v <u>American Swiss Watch Co</u>)*** |

| දිනය සහ වෙලාව | සිද්ධිය | නීතිමය සංකල්පය |
|---|---|---|
| **අඟහරුවාදා** | මහේෂ් රුවන් හමුවීමට ගොස් සිල්වාගෙන් රුවන්ගේ අර්පණය සම්බන්ධයෙන් දැනගත් බව පවසා රුවන් අර්පණය ප්‍රතිග්‍රාහනයට කැමති බව පවසයි. | **වලංගු ප්‍රතිග්‍රහණයක් නැත -** අර්පණකරු විසින් සන්නිවේදනය නොකළ අර්පණයක් ප්‍රතිග්‍රහණය කල නොහැක. තෙවන පාර්ශවයක් හරහා අර්පණය පිලිබඳ ඇති දැනුම ප්‍රමාණවත් නොවේ. |
| **බදාදා** | රුවන් කොළඹ මහේෂ්ගේ කාර්යාලයට අර්පණ ලිපිය තැපැල් කරයි. | දීමනාව දැන් සන්නිවේදනය වී ඇත. - අර්පණලාභියා විසින් අර්පණය ලැබුණු පසු (හෝ සාධාරණ ලෙස ප්‍රවේශ විය හැකි ආකාරයට ලද විට) අර්පණය නීත්‍යානුකූල වේ. |
| **බ්‍රහස්පතින්දා උදෑසන** | අර්පණ ලිපිය මහේෂ් වෙත ලැබෙයි. | දීමනාව දැන් නීත්‍යානුකූලයි - මහේෂ්ට එම අර්පණය නීත්‍යානුකූලව ප්‍රතිග්‍රහණය හැකිය. |
| **බ්‍රහස්පතින්දා** | මහේෂ් ඔහුගේ ප්‍රතිග්‍රහණය කිරීමේ ලිපිය තැපැල් කරයි. | ශීඝ්‍ර තැපැල් රීතිය අදාළ වේ - ප්‍රතිග්‍රහණය නෛතික වන්නේ පිළිගැනීමේ ලිපිය ලැබුණු විට පමණක් නොව තැපැල් කළ විගස ය. ***(<u>Adams</u> v <u>Lindsell</u>, <u>Household Fire Insurance</u> v <u>Grant</u>)*** |
| **සිකුරාදා පෙ.ව. 9:00** | රුවන්ට වඩා හොඳ අර්පණයක් ලැබෙන අතර ඔහු කිලෝග්‍රෑමයකට රු. 1,800 කට විකිණීමට තීරණය කරයි. | අර්පණය ඉල්ලා අස් කිරීමේ අභිප්‍රාය - අර්පණය ඉල්ලා අස් කිරීම, අර්පණය ප්‍රතිග්‍රහණය සිදුවීමට පෙර අර්පණලාභියා වෙත සන්නිවේදනය විය යුතුය. |
| **සිකුරාදා පෙ.ව. 10:00** | රුවන් මහේෂ් වෙත අර්පණය ඉල්ලා අස් කිරීමේ ලිපියක් යවයි. | ප්‍රමාද ව අර්පණය ඉල්ලා අස් කිරීම - තැපැල් රීතිය යටතේ ප්‍රතිග්‍රහණය දැනටමත් සිදුවී ඇත; එබැවින් ඉල්ලා අස් කිරීම අර්ථාන්විත නොවේ. |
| **සිකුරාදා ප.ව. 5:00** | රුවන්ට මහේෂ්ගේ ප්‍රතිග්‍රහණ ලිපිය ලැබේ. | (බ්‍රහස්පතින්දා) තැපැල් කරන අවස්ථාවේ ඇති කරගත් වලංගු ගිවිසුම තහවුරු කරයි. |
| **සෙනසුරාදා උදෑසන** | රුවන්ගේ අර්පණය ඉල්ලා අස්කරගැනීමේ ලිපිය මහේෂ්ට ලැබේ. | නීත්‍යානුකූලව අදාළ නොවන - ගිවිසුම දැනටමත් පිහිටුවා ඇත;එබැවින් මහේෂ්ට ගිවිසුම් කඩ කිරීමට සම්බන්ධයෙන් රුවනට විරුද්ධව නඩු පැවරිය හැකිය. |

***(ලකුණු 05)***

**(c)** පහත සඳහන් ඕනෑම දෙකක්)

- අර්පණය - ගිවිසුමකට එළඹීම සඳහා එක් පාර්ශ්වයක් විසින් තවත් පාර්ශ්වයකට සිදුකරන පැහැදිලි යෝජනාවක්.
- ප්‍රතිග්‍රහණය - අරපණයේ සත්‍ය නියමයන්ට කොන්දේසි විරහිත එකඟතාවයක්.
- ප්‍රතිෂ්ඨාව - පාර්ශවයන් අතර හුවමාරු වන වටිනාකමක් ඇති දෙයක් (මුදල්, භාණ්ඩ හෝ සේවා).
- කැමැත්තේ අව්‍යාජභාවය - ගිවිසුම බලහත්කාරයෙන්, වංචාවෙන්, වැරදි ලෙස නිරූපණය කිරීමෙන් හෝ අනවශ්‍ය බලපෑමකින් තොරව ස්වේච්ඡාවෙන් කළ යුතුය.

- ගිවිසුම් ශක්නුතාවය - පාර්ශවයන් ගිවිසුම්ගත කිරීමට නීත්‍යානුකූලව හැකියාව තිබිය යුතුය (සිහිකල්පනාවෙන් යුක්ත වැඩිහිටියන්).
- ගිවිසුමේ නීත්‍යානුකූලභාවය - කොන්ත්‍රාත්තුවේ අරමුණ නීත්‍යානුකූල විය යුතු අතර රාජ්‍ය ප්‍රතිපත්තියට පටහැනි නොවිය යුතුය.

***(ලකුණු 04)***

| පරිච්ඡේදය 04 - භාණ්ඩ විකිණීමේ නීතිය |
|---|

**(B)**

**(a)** විකුණුම් ගිවිසුමකදී දී, ගිවිසුමේ තත්වයන් පැහැදිලිව වෙනස් අරමුණක් පෙන්නුම් කරන්නේ නම් මිස, විකුණුම්කරුගේ පැත්තෙන් ව්‍යංග කොන්දේසියක් ඇත.

භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ "**13(අ) වගන්තිය**" යටතේ විකුණුම්කරුට භාණ්ඩ විකිණීම සඳහා හොඳ හිමිකමක් තිබිය යුතු බවට ඇති ව්‍යංග කොන්දේසියක් සහතික කිරීමෙන් ගැනුම්කරු ආරක්ෂා කරයි.

"භාණ්ඩ විකිණීමේ ගිවිසුම විකිණීමක් නම්, ගිවිසුමට එළඹෙන අවස්ථාවේදී ද එකී භාණ්ඩ විකිණීමේ ගිවිසුම විකිණීමට එකඟ වීමේ ගිවිසුමක් නම්, භාණ්ඩවල අයිතිය විකුනුම්කරුගෙන් ගැණුම්කරුට මාරු වන අවස්ථාවේදී ද විකුණුම්කරුට භාණ්ඩ විකිණීමට අයිතියක් තිබිය යුතුය."

විකුණුම්කරුට විකිණීමට අයිතියක් නොමැති නම්, ගැනුම්කරුට භාණ්ඩ විකිණීමේ ගිවිසුම ප්‍රතික්ෂේප කර ගෙවන ලද ඕනෑම මුදලක් අයකර ගත හැකිය, මන්ද මෙවන් ව්‍යංග කොන්දේසි උල්ලංඝනය කිරීමක් ගිවිසුමේ මූලයට ගමන් කරයි.

මෙම මූලධර්මය **<u>Rowland</u> v <u>Diwall</u>** නඩුකරයේ දී පැහැදිලිව දක්වා ඇත. එම අවස්ථාවේ දී, පැමිණිලිකරු විත්තිකරුගෙන් මෝටර් රථයක් මිලදී ගෙන සම්පූර්ණ මිල ගෙවා ඇත. මාස කිහිපයකට පසු, මෝටර් රථය විකුණුම්කරු විසින් සොරකම් කර තිබූ එකක් බවත් නීත්‍යානුකූලව සැබෑ හිමිකරුට අයත් බවත් පසුව සොයා ගන්නා ලදී. පොලිසිය මෝටර් රථය සිය භාරයට ගත් අතර, පැමිණිලිකරුට ද නීත්‍යානුකූල හිමිකාරිත්වය ලැබී නැත. විත්තිකරුට (විකුණුම්කරුට) එම මෝටර් රථය සම්බන්ධයෙන් වලංගු හිමිකමක් නොමැති වීම නිසා විකුණුම්කරුට භාණ්ඩ විකිණීම සඳහා හොඳ හිමිකමක් තිබිය යුතු ය යන ව්‍යංග කොන්දේසිය කඩ කර ඇති බව අධිකරණය තීරණය කළේය.
පැමිණිලිකරු මාස කිහිපයක් මෝටර් රථය භාවිතා කර තිබුණද, විකිණීම සිදුවන මොහොතේ උල්ලංඝනය සිදු වූ බැවින්, මෝටර් රථය සබෑ හිමිකරුට හිමි වන අතර පැමිණිලිකරුගේ සම්පූර්ණ ගැනුම් මිල විත්තිකරුගෙන් අයකර ගැනීමට ඔහුට අයිතියක් තිබුණි. මෙම නඩුවෙන් තහවුරු වන්නේ විකුණුම්කරුවෙකුට හොඳ හිමිකමක් නොමැති වූ විට, භාණ්ඩ භාවිතා කිරීම සිදුකර තිබුනද, එයින් ප්‍රතිලාභ ගෙන තිබුනද, ඒ සියල්ල නොසලකා, කොන්දේසියක් (ව්‍යංග) කඩ කිරීම නිමිත්තෙන් ගෙවන ලද සම්පූර්ණ මුදල අයකර ගැනීමට ගැනුම්කරුට අයිතියක් ඇති බවයි.

සලක බලන සිදුවීමට මෙම මූලධර්මය අදාළ කරමින්, නිමල් සුනිල්ගෙන් ලැප්ටොප් පරිගණකයක් මිලදී ගත් අතර, විකුණුම්කරු ඔහුට සම්පූර්ණ හිමිකාරිත්වය අදාල ලැප්ටොප් පරිගණකය සම්බන්ධයෙන් ඇති බවට සහතික විය. කෙසේ වෙතත්, ලැප්ටොප් පරිගණකය විශ්ව විද්‍යාලයේ පරිගණක රසායනාගාරයෙන් සොරකම් කර ඇති බව පසුව වාර්තා වූ අතර, පසුව පොලිසිය එය අත්අඩංගුවට ගත්තේය. සුනිල්ට ලැප්ටොප් පරිගණකය විකිණීමේ අයිතියක් නොතිබූ බැවින්,

භාණ්ඩ විකිණීමේ පනතේ "**13(අ)** වගන්තිය" යටතේ හිමිකම් සම්බන්ධ ව්‍යංග කොන්දේසිය ඔහු උල්ලංඝනය කළේය. **Rowland v Diwall** හි තර්කනය අනුගමනය කරමින්, නිමල්ට ගිවිසුම ප්‍රතික්ෂේප කළ හැකි අතර, ඔහු දැනටමත් ලැප්ටොප් පරිගණකය භාවිතා කර තිබුණද, ඔහු ගෙවූ සම්පූර්ණ ගැණුම් මිල විකුනුම්කරුගෙන් අයකර ගැනීමට අයිතියක් ඇත. එබැවින්, හොඳ හිමිකමක් නොමැතිව භාණ්ඩ විකිණීම සම්බන්ධයෙන් සුනිල්ට එරෙහිව නිමල්ට සාර්ථක නීතිමය පියවර ගත හැකිය.

***(ලකුණු 06)***

**(b)**

**(i)** අවිනිශ්චිත භාණ්ඩ

- පාර්ශ්වයන් එකඟ වූ නමුත් තවමත් නිසි ලෙස හඳුනාගෙන නොමැති භාණ්ඩ, එනම් එම භාණ්ඩ මෙතෙක් තහවුරු නොකළ භාණ්ඩ වේ.

**(ii)** අනාගත භාණ්ඩ

- අනාගත භාණ්ඩ යන්නෙන් අදහස් කරන්නේ භාණ්ඩ විකිණීමේ ගිවිසුමකට එළඹීමෙන් පසු විකුණුම්කරු විසින් අත්පත් කර ගන්න හෝ නිෂ්පාදනය කරන භාණ්ඩ වේ.

***(ලකුණු 04)***

***(ලකුණු 10)***

***(මුළු ලකුණු 25)***

***C කොටසෙහි අවසානය***

## *Notice:*

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.
These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

*© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*